# ශ්‍රීපාදය හා බැඳුණු අතීත සංචරණ ක්‍රියාදාමය පිළිබඳ විමසීමක්

ආචාර්ය චන්දිම බෝගහවත්ත[1]

ඉන්දියානු සාගර මධ්‍යයෙහි දිවයිනක් ලෙස පිහිටීමත් සුවිශේෂී සංස්කෘතිකාංග උරුම කර ගෙන සිටීමත් නිසා භූගෝලීය වශයෙන් ස්වාධීන වුව ද ශ්‍රී ලංකාව අතීතයෙහි සිට ම විදේශීන්ගේ අවධානයට පාත්‍ර වී තිබේ. ඒ සඳහා ආර්ථික මෙන් ම ආගමික උරුමයන් ද බෙහෙවින් ඉවහල්ව තිබේ. බටහිර ලෝකයෙහි මෙන් ම ආසියානු සංස්කෘතියෙහි ද කඳු පර්වත වන්දනය ජනප්‍රිය අංගයක්ව පැවතිනි. විශ්වසනීය දෙවියෙක් හෝ වස්තුවක් හෝ තත් පර්වතයෙහි ගෞරවණීය බව ස්ථාපිත කරන ලදී. ග්‍රීසියේ ඔලිම්පස්, ඔත්‍රිස් හා ඉඩා ද චීනයේ ථායි ෂන්ග් ආදී ප්‍රධාන පඤ්ච මහා පර්වතයන් ද ටිබෙටයේ කයිලාස්, ජපානයේ ෆූජි, අප්‍රිකානු සහ ඇමෙරිකානු භූමීන්හි ඇති කිලිමංජාරෝථ, මාචු පිජ්ජු මෙන් ම භාරතයේ හිමාලය ද ඊජිප්තුවේ සීනායි කන්ද ද, එසේම ලක්දිව සමණල කන්ද ද මෙම විශ්වාසයන් පදනම් කර ගනිමින් භක්තිකයින් අත්පත් කරගත් ඓතිහාසික ගිරිපර්වත ලෙස ඓතිහාසික ලේඛනයන්හි සඳහන් වී තිබේ. මින් ශ්‍රී ලංකාවෙහි පිහිටා ඇති සමණල කන්දට හිමි වන්නේ සුවිශේෂී ඓතිහාසික වටිනාකමකි.

මහාවංසයට අනුව මූල ඓතිහාසික යුගයෙහි පවා සුමන සමන් දෙවියන්ගේ වාසස්ථානය ලෙසට ජනප්‍රසාදයට පත්ව තිබූ මෙයට බෞද්ධාගමික අර්ථයක් ස්ථාපිත වන්නේ බුදුරජාණන්වහන්සේ බුද්ධත්වයෙන් අට වැනි වර්ෂයේදී සිදු කළ ලංකාගමනයත් සමගිනි. සංස්කෘත සාහිත්‍යයෙහි රත්නගිරි ලෙස ද මලය ප්‍රදේශයෙහි පිහිටීම නිසා මලයගිරි ලෙස ද රෝහණයට අයත් යන අදහසින් රෝහණගිරි ලෙසින් ද දමිළ සාහිත්‍යයෙහි ස්වර්ගරෝහණම් ද පාළි සාහිත්‍යයෙහි සමන්තකූට මෙන් ම සිංහල සාහිත්‍යයෙහි සමණොළ ලෙසින් ද දක්වා තිබේ. චීන මූලාශ්‍රයයෙහි ෂත්ස ෂන්ග්, සිලාන් ෂන්ග් හෝ ෆෝ ෂන්ග් මෙන් ම ලන්කා ෂන්ග් ලෙස විවිධ නම්වලින් ද යුරෝපීයයන් ඇඩම්ස් පීක් ලෙස ද අරාබීන් සහ පර්සියානුවන් අල් රොහුන් ද පෘතුගීසීන් පිකො ද ඇඩම් ලෙසින් ද හඳුන්වා තිබේ. මෙම මූලාශ්‍රය ක්‍රි. පූ. හයවන සියවසෙහි සිට අඛණ්ඩව දේශීය මෙන් ම විදේශීය සාහිත්‍යයෙහි අන්තර්ගතව තිබේ.

ඔලිම්පස් කන්ද හැරුණු කොට ලෝකයෙහි අඛණ්ඩව සජීවී ස්මාරකයක් ලෙසින් පවතින්නේ ශ්‍රීපාදය යි. වෙළඳාමට සංචාරයට මෙන් ම දේශපාලනික මැදිහත්කරුවන් ලෙස ග්‍රීක රාජ්‍යයට ගිය පුද්ගලයින් ඔලිම්පස් කන්ද පිළිබඳ විස්තර බාහිර ලෝකයට අනාවරණය කළා සේම ඉන්දියානු සාගරය ඔස්සේ චාරිකා කළ සියලු යාත්‍රිකයින් ශ්‍රීපාදයෙහි ප්‍රවෘත්තිය ලෝකයට ගෙන ගියේය. එම නිසා එහි ඓතිහාසික අගය මෙන් ම ආගමික අගය ද ජනවිඥානය තුළ ස්ථාපිත වී තිබේ. ලෝකයෙහි ආගමික සංචරණය ආරම්භ කරන ලද මූලික සමාජ කණ්ඩායම් අතර ශ්‍රී ලාංකිකයන්ට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. එම සංචරණයන් අභ්‍යන්තර පරිශ්‍රයන්හි මෙන් ම බාහිර පරිශ්‍රයන්හි ද සිදු කරනු ලැබ ඇති බව සීහළවත්ථුප්පකරණය සහ අටුවා ග්‍රන්ථයන්හි සඳහන් තොරතුරුවලින් පැහැදිලි වේ. ආගමික කරුණු මූලිකව සිදු වුව ද සීගිරි ගී ඇසුරින් පැහැදිලි වන්නේ විනෝදය සහ විශ්‍රාන්තිය ද අරමුණු කරගනිමින් මිනිසුන් ස්ථායි පරිසරයන් වෙතින් තාවකාලිකව විතැන් වූ බවකි. එම විතැන්වීම් නූතන සංචරණ න්‍යායයන් සමග සංසන්දනය කිරීමේදී වර්තමාන සංචරණය යන ක්‍රියා

1 ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

දාමය අත්පත් කරගත් රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාවට සුවිශේෂී ස්ථානයක් හිමි වන බව පෙනේ. මෙම ප්‍රචාරණය අනුව මූල ඓතිහාසික යුගයෙහි සිට ම ශ්‍රීපාදය බහු ආගමික සංචාරකයින්ගේ ශුද්ධස්ථානයක් වූ බව පෙනේ. එම නිසා ශ්‍රී ලංකාව අතීතයෙහි හැඳින්වීම සඳහා ශ්‍රීපාදයෙහි නම රටෙහි නම ලෙස භාවිත කරන්නට විදේශීන් පෙළඹී ඇති ආකාරය චීන මූලාශ්‍රය ඇසුරින් පැහැදිලි වේ. මෙම පර්යේෂණ පත්‍රිකාවෙහි අරමුණ වන්නේ ශ්‍රීපාදය අතීත සංචාරක ආකර්ෂණයක් ලෙස පැවතුණු ආකාරය සාහිත්‍යමය සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරින් විමසා බැලීම යි. මෙම පර්යේෂණ අරමුණ ඉටු කර ගැනීම සඳහා ශිලා ලේඛන සාධක මෙන් ම දේශීය හා විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය සේ ම ජනශ්‍රැතිගත තොරතුරුද උපයෝගී කර ගනු ලැබේ.

**ප්‍රමුඛ පදඃ** ශ්‍රී පාදය, ආගමික සංචරණය, චීන මූලාශ්‍රය, විනෝදය සහ විශ්‍රාන්තිය, ආගමික විශ්වාස